(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 5(2).]

# පාර්ලිමේන්තුවේ අංක 5 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2012 ජනවාරි මස 20 වැනි සිකුරාදා**

## 2012 පෙබරවාරි මස 08 වැනි බදාදා
## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ජාතික මංමාවත් පනත යටතේ නියෝග,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි අනුව්‍යවස්ථාව සහ 2008 අංක 40 දරන ජාතික මංමාවත් පනතේ 13 සහ 14 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එම පනතේ 89 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ, ගාස්තු ගෙවිය යුතු ජාතික මහාමාර්ගයේ භාවිතා කරන සෑම වාහනයකම රියදුරකුගෙන්ම අය කළ යුතු ගාස්තු පිළිබඳව ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2011 නොවැම්බර් 18 දිනැති අංක 1732/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරනු ලැබ, 2012.01.17 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

## 2012 පෙබරවාරි මස 09 වැනි බ්‍රහස්පතින්දා
## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1132/'11

ගරු රවී කරුණානායක මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්තමානයේ පවතින ඉතා අධික විදුලි ගාස්තු අඩුකර පාරිභෝගිකයන්ට සහනයක් ලබා දෙන දිනය කවරේද;

(ii) ලංකා විදුලිබල මණ්ඩලය හා පෞද්ගලික අංශය මගින් ඉදිරි වර්ෂ 10 තුළ ඇතිකිරීමට යන නව විදුලි උත්පාදක ව්‍යාපෘති කවරේද;

(iii) ඉහත සඳහන් ව්‍යාපෘති මගින් උත්පාදනය කරනු ලබන විදුලි ඒකකයක අපේක්ෂිත පිරිවැය කොපමණද; සහ

(iv) ඉහත පරිදි උත්පාදනය කෙරෙන විදුලි ඒකකයක සාමාන්‍ය විකිණුම් මිල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ලංකා විදුලි බල මණ්ඩලයේ සේවක අතිරික්තයක් පවතීද; සහ

(ii) එසේ නම්, එම තත්ත්වය නිවැරදි කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1400/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ගාල්ල සිට මාතර දක්වා දුම්රිය මාර්ගය නවීකරණය කර ඇතත්, එම මාර්ගයේ දුම්රිය හරස් මාර්ග විශාල සංඛ්‍යාවක ආරක්ෂිත ගේට්ටු සහ සංඥා ලාම්පු සවිනොකිරීම හේතුවෙන් එම ප්‍රදේශවල ජනතාවගේ ජීවිත දැඩි අනතුරුදායක තත්වයකට පත්ව ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ස්ථානවල ආරක්ෂිත ගේට්ටු සහ සංඥා ලාම්පු කඩිනමින් සවි කිරීම සඳහා කටයුතු කරන්නේද;

(ii) ඒ සඳහා මේවන විටත් සැලසුම් සකස් කර තිබේද;

(iii) එසේ නම්, ඒවායෙහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1492/'11

ගරු අජිත් කුමාර මහතා,— පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ මේ වනවිට සේවය කරන උපදේශකයින් සංඛ්‍යාව;

(ii) ඔවුන්ගේ නම්, අධ්‍යාපන සුදුසුකම් සහ වගකීම්;

(iii) ඔවුන් වෙත ගෙවනු ලබන වැටුප් සහ දීමනා;

(iv) පසුගිය මාසය සඳහා ගෙවන ලද සියලු දීමනාවල එකතුව;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නිලරථ ලබාදී ඇති උපදේශකයින්ගේ නම්, ලබාදී ඇති නිලරථ සංඛ්‍යාව සහ ඒවායේ විස්තර කවරේද;

(ii) ඔවුන් වෙත ඉන්ධන දීමනා ලබාදෙන්නේ නම් එක් එක් උපදේශකවරයාට ලබාදෙන ඉන්ධන දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඔවුන් වෙත දුරකථන පහසුකම් ලබා දෙන්නේ නම්, මේ වන විට දුරකථන පහසුකම් ලබා දී ඇති උපදේශකයන්ගේ නම් කවරේද;

(ii) දුරකථන දීමනාවක් ගෙවන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබා දී ඇති දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1693/'11

ගරු අනුර දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 'රක්නා ලංකා' ආරක්ෂක සේවයේ සභාපතිවරයා කවුරුන්ද;

(ii) 'රක්නා ලංකා' ආරක්ෂක සේවය මගින් එක් එක් ආයතනයට ආරක්ෂාව සපයනු ලබන වාර්ෂික මිල ගණන්, වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම එක් එක් ආයතන වෙනුවෙන් ලබා දී ඇති ආරක්ෂක නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iv) රක්නා ලංකා ආරක්ෂක සේවයේ ආරක්ෂක නිලධාරියෙකු වෙනුවෙන් සේවාලාභීන් ගෙවනු ලබන මුදලින් රක්නා ලංකා ආයතනය විසින් ආරක්ෂක නිලධාරියෙකුට ගෙවනු ලබන මුදල කොපමණද;

(v) 'රක්නා ලංකා' ආයතනයේ සේවය කරනු ලබන සියලු දෙනා රාජ්‍ය ආරක්‍ෂක සේවාවන්හි නිරත වූවන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1719/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශයට අයත් ව්‍යවස්ථාපිත මණ්ඩල හා සංස්ථා වෙනුවෙන් පත්කොට ඇති අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජිකයින් කවුරුන්ද;

(ii) එම අධ්‍යක්ෂ මණ්ඩල සමාජිකයින් පත්කරන ලද බලධාරියා කවුරුන්ද;

(iii) අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය පළපුරුද්ද කවරේද;

(iv) එම එක් එක් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයා වෙනුවෙන් ගෙවනු ලබන වැටුප් හෝ දීමනා, ලබා දී ඇති වාහන, දුරකතන ඇතුළු පහසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1727/'11

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හිඟුරාන සීනි කර්මාන්තශාලාවේ අයිතිකරුවන් සහ උක් ගොවීන් අතර ගිවිසුමක් තිබේද;

(ii) එසේ නම්, එම ගිවිසුම සභාගත කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) උක් ගොවීන් අදාළ ඉඩම්වල උක් වගා කිරීම ප්‍රතික්ෂේප කරන බව එතුමා දන්නෙහිද?

(ඇ) (i) එම උක් ගොවීන්ගේ ඉල්ලීම් කවරේද;

(ii) එම ඉල්ලීම්වලට සාධාරණ විසඳුමක් ලබා දීමට පියවර ගන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1860/'11

ගරු සිවශක්ති ආනන්දන් මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වවුනියාව, කෝවිල්කුලම් ගම්මානයේ ළදරු පාසලක් සඳහා ගොඩනැගිල්ලක් ඉදිකළ බවට ව්‍යාජ තොරතුරු දක්වා, සිදු නොකළ ඉදිකිරීමක් වෙනුවෙන් රු. 177,180.66ක මුදලක් වවුනියාව නගර සභාවෙන් වංචනිකව ලබා දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම මුදල් ලබා ගත් අය කවුරුන්ද;

(ii) එම වංචනික ක්‍රියාව සිදුකළ තැනැත්තාගෙන් ඉහත මුදල ආපසු අයකර ගැනීමට පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1873/'11

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා රාජ්‍ය දූත මෙහෙවරෙහි යෙදෙන පුද්ගලයන්ගේ පුද්ගලික ගමන් මලු මෙහෙයවීම සිදු කරනු ලබන ආයතනය කවරේද;

(ii) එම ආයතනය තෝරා ගැනීමේදී විධිමත් ටෙන්ඩර් ක්‍රියා පටිපාටියක් අනුගමනය කළේද;

(iii) එසේ නම්, එම ගමන් මලු මෙහෙයවීම සිදුකරමින් සිටි ආයතනය ඉවත්කර වෙනත් ආයතනයක් වෙත පවරනු ලැබූ පදනම කවරේද;

(iv) පසුගිය වර්ෂය තුළදී එම කාර්යය සඳහා නව ආයතනය වෙත ගෙවන ලද මුදලත් ඊට පෙර ක්‍රියාත්මක වූ පුද්ගලික ආයතනය වෙත වර්ෂයක් සඳහා ගෙවූ මුදලත් අතර වෙනස කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1912/'11

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කොළඹ මුඩුක්කු සහ පැල්පත්වාසීන්ගේ නිවාස ගැටලු විසඳීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, කොළඹ නගර සභාව සහ තිරසාර පුරවර වැඩසටහන සමග "රියල් එස්ටේට් එක්ස්චේන්ජ් පෞද්ගලික සමාගම" (REEL) ඒකාබද්ධ කරන ලද බව එතුමා දන්නෙහිද?

(ආ) 2006 වර්ෂයේ සිට මේ දක්වා,

(i) REEL පෞද්ගලික සමාගමේ අධ්‍යක්ෂවරුන්, සභාපතිවරුන් සහ ප්‍රධාන ගණන්දෙන නිලධාරීන් කවරේද;

(ii) භාණ්ඩාගාරය, රාජ්‍ය බැංකු සහ රාජ්‍ය ආයතන විසින් REEL වෙත පවරන ලද අරමුදල් පිළිබඳ තොරතුරු කවරේද;

(iii) එක් එක් පැවරුමේ අරමුණ සහ ප්‍රක්ෂේපිත සහ තථ්‍ය ප්‍රතිඵල කවරේද;

(iv) මිලියන පහ ඉක්මවූ පිරිවැය අයිතම පිළිබඳ තොරතුරු සහ එක් එක් අනුමතියේ අරමුණු කවරේද;

(v) REEL හි වර්තමාන මූල්‍යමය තත්ත්වය කුමක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) 2010 ජනවාරි සිට මේ දක්වා REEL හි කවර හෝ පමණ ඉක්මවා වියදම් කිරීම, වංචා සහ/හෝ දූෂණ පිළිබඳ යම් අභ්‍යන්තර පරීක්ෂණ, විගණන හෝ අපරාධ විමර්ශණ සිදු වී ඇත්ද;

(ii) එසේ නම්, ඒවායේ ප්‍රතිඵල කවරේද;

(iii) ඉහත (ඇ) (i) පරිදි නිරීක්ෂිත විෂමාචාර සම්බන්ධයෙන් යෝජිත විසඳුම් ක්‍රියාමාර්ග සහ එකී දිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1913/'11

ගරු නිරෝෂන් පෙරේරා මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පුත්තලම දිස්ත්‍රික්කයේ, මාරවිල රජයේ රෝහලේ මෘත ශරීරාගාරයේ ශීතාගාර පහසුකම් නොමැති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම රෝහල සඳහා ශීතාගාරයක් ඉදිකිරීමට සැලසුම් කර තිබේද;

(ii) එසේ නම්, එම ශීතාගාරය ඉදිකිරීමට ඇස්තමේන්තු ගත මුදල කොපමණද;

(iii) කොපමණ කාලයක් තුළ එම ශීතාගාරය ඉදිකිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) දැනට එම රෝහලේ සේවය කරන අධිකරණ වෛද්‍ය නිලධාරීන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) රජයේ නිවාඩු දිනයකදී හෝ අධිකරණ වෛද්‍ය නිලධාරිවරයා නිවාඩු ලබා ඇති අවස්ථාවකදී එම රෝහලේ පශ්චාත් මරණ පරීක්ෂණ පැවැත්වීම සිදු නොවන බැවින්, ශීතාගාර පහසුකම් නොමැති එම රෝහලේ මෘත ශරීර කල් තබා ගැනීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1914/'11

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බණ්ඩාරගම පොලිස් ස්ථානය පිහිටි වත්මන් ගොඩනැගිල්ල ඉදිකරන ලද වර්ෂය කවරේද;

(ii) එම ගොඩනැගිල්ල මේ වන විට දිරාපත්ව, අබලන්ව ඇති බව දන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) බණ්ඩාරගම පොලිසියේ කටයුතු නිසි පරිදි කරගෙන යාම සඳහා ප්‍රමාණවත් පහසුකම් සහිත නව ගොඩනැගිල්ලක් ඉදිකිරීමට කටයුතු කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1978/'11

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මොනරාගල දිස්ත්‍රික්කයේ, බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගල්ටැම්මණ්ඩිය ග්‍රාම නිලධාරී වසමේ පදිංචි ඩී. එම්. පියදාස, ඩී. එම්. ගුණදාස, ආර්. එම්. අමරදාස, ටී. ඒ. සරත්, එම්. පී. ගුණපාල, ඩී. එම්. රත්නසිරි, ඩී. එම්. සරත්, ජේ. එම්. ප්‍රේමලතා සහ එච්. එම්. ගුණසේකර යන අය සමෘද්ධි සහන ලැබූ අඩු ආදායම්ලාභීන් බවත්;

(ii) මේ වනවිට ඔවුන්ගේ සමෘද්ධි සහනාධාරය කපා හැර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) සමෘද්ධි සහනාධාරය අහිමි වීම නිසා ඉතා අසරණභාවයට පත්ව සිටින මෙම පිරිසට නැවත සමෘද්ධි සහනාධාරය ලබාදීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1989/'11

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වාවකච්චේරි නගර සභා ප්‍රදේශය තුළ පාසල් 12කට අයත් වැසිකිළිවල අපද්‍රව්‍ය ඉවත් කිරීමට වාවකච්චේරිය නගර සභාව අපොහොසත් වී ඇති බවත්;

(ii) එම තත්ත්වය පිළිබඳව අදාළ පාසල්වල පරිපාලනය විසින් නගර සභාවට දන්වා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මෙම ගැටලුකාරී තත්ත්වය විසඳීම සඳහා වාවකච්චේරි නගර සභාවට අවශ්‍ය උපදෙස් ලබා දී, එම පාසල්වලට නගර සභාවෙන් ලබාදිය හැකි සියලු සම්පත් නිසියාකාරව ලබාදීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1994/'11

ගරු තිලංග සුමතිපාල මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ත්‍රිකුණාමලය, නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම්වරයා එම කාර්යාලයේ රාජකාරී ආරම්භ කළ දිනය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) එම ප්‍රාදේශීය ලේකම්වරයාගේ;

(i) පළමු පත්වීම් දිනය හා රාජකාරී ස්ථානය කුමක්ද;

(ii) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ ශ්‍රේණිය කවරේද;

(iii) තනතුර හෙබවීමේ පදනම කුමක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) නිලධාරීන්ට හා පුද්ගලයන්ට එරෙහිව එම ප්‍රාදේශීය ලේකම්වරයා විසින් දිස්ත්‍රික් ලේකම්වරයාට හා ආණ්ඩුකාරවරයාට මෙතෙක් කර ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(ii) එම ප්‍රාදේශීය ලේකම්වරයාට හා එම කාර්යාලයේ ග්‍රාම නිලධාරීන්ට එරෙහිව දිස්ත්‍රික් ලේකම්වරයාට, ආණ්ඩුකාරවරයාට හා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(iii) ප්‍රාදේශීය ලේකම්වරයාට එරෙහිව පැමිණිලි සංක්ෂිප්තව කවරේද;

(iv) පැමිණිලි ලැබී ඇති ග්‍රාම නිලධාරින් සහ ඔවුන්ගේ කොට්ඨාස කවරේද;

(v) එම පැමිණිලි සම්බන්ධයෙන් ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) එම ප්‍රාදේශීය ලේකම්වරයා පළාත් ඉඩම් කොමසාරිස්ට එරෙහිව නැගෙනහිර ආණ්ඩුකාරවරයාට කළ පැමිණිල්ල කවරේද;

(ii) ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා තිබේද;

(iii) එහි නිර්දේශ කවරේද;

(iv) මේ වන විට ඒ සම්බන්ධයෙන් ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

2007/'11

ගරු වසන්ත අලුවිහාරේ මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංගම අර්ථසාධක අරමුදලින් පෙර අවස්ථා කීපයකදී නීති විරෝධීව සේවා පක්ෂයේ පරිහරණයට මුදල් ලබා ගෙන ඇති බවත්;

(ii) නැවතත් එසේ මුදල් ලබා ගැනීමට කටයුතු කරමින් සිටින බවත්;

(iii) ඊට එරෙහි වූ සේවකයින් කිහිප දෙනෙකුට ස්ථාන මාරුවීම් ලබා දී ඇති බවත්;

(iv) අදාළ අරමුදල ශ්‍රී ලංකා මහ බැංකුව යටතට පත්කිරීමට කටයුතු කරමින් සිටින බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) 1991 වර්ෂයේ ශ්‍රී ලංගමය ජනතා සන්තක සමාගමක් බවට පත්කිරීමේදී එහි අර්ථසාධක අරමුදලේ තිබූ සම්පූර්ණ මුදල;

(ii) ඉන්පසු එයින් ප්‍රතිලාභ ලබාගෙන සාමාජිකත්වයෙන් ඉවත්වූ සංඛ්‍යාව සහ ඔවුන්ට ගෙවන ලද මුදල;

(iii) අඛණ්ඩව එම අරමුදලේ සාමාජිකත්වය දැරූ සංඛ්‍යාව සහ ඔවුන් නමින් ඉතිරිව තිබූ මුදල;

කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) සේවා පක්ෂය එම අරමුදලින් වරින්වර ලබාගත් මුදල් සහ මුදල් ලබාගත් පදනම කවරේද;

(ii) ලබාගත් මුදල් ප්‍රතිපූරණය කර තිබේද;

(iii) මෙම අරමුදල ශ්‍රී ලංකා මහ බැංකුව යටතට පත්කළහොත් මෙතෙක් සේවකයින් ලබාගත් වරප්‍රසාද අහිමිවේද;

(iv) එසේ නම්, එම වරප්‍රසාද ආරක්ෂා කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2012 පෙබරවාරි මස 10 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1306/'11

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය වර්ෂ 10 තුළ වාර්ෂික පදනමින් රටට ලැබුණු මුළු ප්‍රේෂණ ප්‍රමාණය ඇමරිකානු ඩොලර් සහ ශ්‍රී ලංකා රුපියල්වලින් කොපමණද;

(ii) එම ප්‍රේෂණ ලැබුණු රටවල නම් කවරේද;

(iii) පසුගිය වර්ෂ පහක කාලය තුළ එක් එක් වර්ෂයේදී ඉහත සඳහන් එක් එක් රටවලින් එක් පුද්ගලයකුට ලැබුණු සාමාන්‍ය ප්‍රේෂණ ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) අපේ විදේශ සංචිත ආරක්ෂා කර ගැනීමට උපකාරීවන පුරවැසියන්ට ලබාදෙන ප්‍රතිලාභ කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1493/'11

ගරු අජිත් කුමාර මහතා,— නැවත පදිංචි කිරීමේ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශයේ මේ වනවිට සේවය කරන උපදේශකයින් සංඛ්‍යාව;

(ii) ඔවුන්ගේ නම්, අධ්‍යාපන සුදුසුකම් සහ වගකීම්;

(iii) ඔවුන් වෙත ගෙවනු ලබන වැටුප් සහ දීමනා;

(iv) පසුගිය මාසය සඳහා ගෙවන ලද සියලු දීමනාවල එකතුව;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නිලරථ ලබාදී ඇති උපදේශකයින්ගේ නම්, ලබාදී ඇති නිලරථ සංඛ්‍යාව සහ ඒවායේ විස්තර කවරේද;

(ii) ඔවුන් වෙත ඉන්ධන දීමනා ලබාදෙන්නේ නම් එක් එක් උපදේශකවරයාට ලබාදෙන ඉන්ධන දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඔවුන් වෙත දුරකථන පහසුකම් ලබා දෙන්නේ නම්, මේ වන විට දුරකථන පහසුකම් ලබා දී ඇති උපදේශකයන්ගේ නම් කවරේද;

(ii) දුරකථන දීමනාවක් ගෙවන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබා දී ඇති දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1567/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අම්පාර දිස්ත්‍රික්කයට අයත්, මහඔය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මහඔය සිට පොල්ලේබැද්ද දක්වා මාර්ගය සම්බන්ධ කරමින් ඉදිකර ඇති යකඩ පාලම දිරාපත්ව, අබලන් වී ඇති බැවින් ජන ජීවිත දැඩි අවදානමට ලක්ව ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පාලමේ ප්‍රතිසංස්කරණ කටයුතු කඩිනමින් ආරම්භ කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) ඒ සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(iv) එසේ නම්, වෙන් කරන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1612/'11

ගරු ඊ. සරවනපවන් මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) යාපනය මහනගර සභාවේ නගරාධිපති, සභාවේ අනුමතියකින් තොරව අත්තනෝමතික තීරණ ගනිමින්, යාපනය නගරයේ වගුරුබිමක සිව්මහල් ව්‍යාපාරික ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා පෞද්ගලික ව්‍යාපාරිකයෙකුට අනුමතිය ලබාදී ඇති බවත්;

(ii) යාපනයේ හිටපු පුරපති දිවංගත රවිරාජ් මහතා එම වගුරුබිමෙහි මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා කළ යෝජනාවක් පස් පිළිබඳ සිදු කළ ශක්‍යතා වාර්තාවේ නිර්දේශ හේතුවෙන් ක්‍රියාත්මක නොකළ බවත්;

(iii) කිසිදු පස් පරීක්ෂාවකින් තොරව එම වගුරුබිමෙහි මේ වන විට සිව්මහල් ගොඩනැගිල්ලක් ඉදිකරනු ලබන බවත්;

(iv) එම ඉදිකිරීම පසුකාලීනව ජීවිත හා දේපළ හානි සිදුවීමට හේතුවිය හැකි බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත ගොඩනැගිල්ල ඉදිකිරීමටත් පෙර ඉදිකිරීම්කරු කඩ කාමර කිහිපයක් විකුණා ඇති බවත්;

(ii) එහිදී රු. 19,000,000කට විකුණනු ලැබූ කඩ කාමරවලට රු. 11,000,000කට පමණක් ඔප්පු ලියා අත්තිකාරම් වශයෙන් රු. 50,000 බැගින් ලබාගෙන ඇති බවත්;

(iii) එමගින් මහනගර සභාවට ආදායම අහිමිවීමක් හා ආදායම් බදු වංචාවක් සිදුව ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) ඉහත තත්ත්වය වැළැක්වීමට මූලික පරීක්ෂණයක් පවත්වා නිසි පියවර ගැනීමට කටයුතු කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1694/'11

ගරු අනුර දිසානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා පුත්‍ර බැංකුව පිහිටුවීමේ අරමුණ කුමක්ද;

(ii) එම බැංකුව පිහිටුවනු ලැබූ දිනයේ සිට මේ දක්වා ණය ලබා දී තිබෙන පුද්ගලයින් සංඛ්‍යාව හා ණය ප්‍රමාණය කොපමණද;

(iii) 2011 වර්ෂය දක්වා ණය ආපසු අය කර ගැනීමේ ප්‍රතිශතයන් කවරේද;

(iv) මිලියන 50ට වැඩි, මිලියන 100ට වැඩි හා මිලියන 200ට වැඩි වටිනාකමින් යුත් ණය ලබා දෙන ලද පුද්ගලයින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1720/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශයට අයත් ව්‍යවස්ථාපිත මණ්ඩල හා සංස්ථා වෙනුවෙන් පත්කොට ඇති ක්‍රියාකාරී අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් කවුරුන්ද;

(ii) එම ක්‍රියාකාරී අධ්‍යක්ෂ මණ්ඩල සමාජිකයින් පත්කරන ලද බලධාරියා කවුරුන්ද;

(iii) ක්‍රියාකාරී අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය පළපුරුද්ද කවරේද;

(iv) එම එක් එක් ක්‍රියාකරී අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයා වෙනුවෙන් ගෙවනු ලබන වැටුප් හෝ දීමනා, ලබා දී ඇති වාහන, දුරකතන ඇතුළු පහසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1861/'11

ගරු සිවශක්ති ආනන්දන් මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඩෙංගු මර්දනය සඳහා උතුරු පළාත් ආණ්ඩුකාරවරයා විසින් වවුනියාව නගර සභාවට 2009 වර්ෂයේදී වෙන්කරන ලද මුදල කොපමණද;

(ii) එම මුදල් වියදම් කිරීමට අදාළ ගිණුම් වාර්තා හා විස්තර මෙතෙක් නගර සභාවට ඉදිරිපත් නොකිරීමට හේතුව කවරේද;

(iii) එම ගිණුම් වාර්තා හා විස්තර නගර සභාවට ඉදිරිපත් කරවීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1874/'11

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුලියාපිටිය නගරයේ පිහිටා ඇති ලංකා විදුලි බල මණ්ඩලයේ, වයඹ පළාත් කාර්යාලයට අයත් තුන් මහල් ගොඩනැගිල්ලෙහි ඉඩ ප්‍රමාණය වර්ග අඩි කොපමණද;

(ii) එම ගොඩනැගිල්ලේ කාර්යාල කටයුතු සඳහා පමණක් භාවිතා කරන ඉඩ ප්‍රමාණය කොපමණද;

(iii) අදාළ ගොඩනැගිල්ල තුළ කාර්යාල කටයුතු සඳහා ප්‍රමාණවත් ඉඩ පහසුකම් තිබියදී එම ගොඩනැගිල්ල ඉදිරිපිට ඇති වෙනත් ගොඩනැගිල්ලක් සඳහා වැඩිපුර මුදල් ගෙවමින් විදුලි බල මණ්ඩලය විසින් කුලියට ලබා ගැනීමට හේතුව කවරේද;

(iv) කුලියාපිටිය මැතිවරණ කොට්ඨාසය තුළ ලංකා විදුලි බල මණ්ඩලය මගින් කුලී හෝ බදු පදනම මත ලබා ගෙන ඇති වෙනත් ගොඩනැගිලි කවරේද;

(v) පසුගිය වර්ෂ තුනක කාලය සඳහා එම එක් එක් ගොඩනැගිල්ල වෙනුවෙන් ගෙවනු ලැබූ කුලිය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1910/'11

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අමාත්‍යාංශයේ ලේකම් එම්. එස්. මොහොමඩ් මහත්මිය 2011 මැයි හා ජූනි මාසවල ලැබූ වැටුප් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මොහොමඩ් මහත්මිය 2011 සැප්තැම්බර් මාසයේදී ලබා ගත් වැටුප කොපමණද;

(iii) 2011 වර්ෂය තුළ ලේකම්වරියගේ වැටුප් වර්ධක වැඩි කරගෙන තිබේද;

(iv) අමාත්‍යාංශයේ ලේකම්වරියගේ රියදුරාට 2011 වර්ෂය තුළ වැටුප් වර්ධක ලබා දී තිබේද;

(v) එසේ නම්, ලබා දී ඇති වැටුප් වර්ධකවල වටිනාකම කවරේද;

(vi) එම වැටුප් වර්ධක ලබාදී වැටුප් වැඩි කර ඇති පදනම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1915/'11

ගරු අජිත් පී. පෙරේරා මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2005, 2006, 2007, 2008, 2009 සහ 2010 වර්ෂවලදී ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල වෙතින් උපාධි ලබාගත් ශිෂ්‍ය සංඛ්‍යාව එක් එක් විශ්වවිද්‍යාලය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම උපාධිධාරීන් අතරින් අභ්‍යන්තර ශිෂ්‍යයන් හා බාහිර ශිෂ්‍යයන් වශයෙන් උපාධි ලබාගත් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) බාහිර උපාධි පාඨමාලා පිළිබඳ රජයේ ප්‍රතිපත්තිය කුමක්ද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1990/'11

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බදුල්ල දිස්ත්‍රික්කයේ, වියලුව ප්‍රදේශයේ පිහිටි ගලඋඩ නමැති ගම්මානයට මේ දක්වා නළ ජල පහසුකම් ලබා නොදීම හේතුවෙන් එම ප්‍රදේශයේ ජනතාව දැඩි දුෂ්කරතාවයකට මුහුණ දී ඇති බවත්;

(ii) නළ ජල සැපයුමක් ලබාදී තම පානීය ජල අවශ්‍යතාවය සපයා දෙන ලෙස ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ බණ්ඩාරවෙල ශාඛාව වෙත එම ප්‍රදේශයේ ජනතාව විසින් ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ගලඋඩ ප්‍රදේශයේ ජීවත්වන 200 කට අධික පවුල්වලට අවශ්‍ය පානීය ජල අවශ්‍යතාව සපුරාලීම සඳහා නළ ජල පහසුකම් සපයාදීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2001/'11

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බුත්තල නගරයේ ඉදිකර ඇති නව ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ පිහිටි වෙළඳ කුටි 17න් ධීවර සංස්ථාවට වෙන්කළ අංක 11 දරන වෙළඳ කුටිය හැරුණු කොට, අංක 4 සිට 17 දක්වා වෙළඳ කුටි සියල්ලම ටෙන්ඩර් කැඳවා එක් වෙළඳ කුටියක් රුපියල් ලක්ෂ 20ක පමණ මුදලකට ලබාදුන් බවත්;

(ii) අංක 1, 2 සහ 3 යන වෙළඳ කුටි සභාවේ අනාගත අවශ්‍යතාවයන් සඳහා යෙදවීම පිණිස ටෙන්ඩර් මගින් ලබා නොදීමට මාසික සභා රැස්වීමේදී තීරණයකට එළැඹි බවත්;

(iii) පසුව එම වෙළඳකුටි තුන වෙනුවෙන් තම හිතවතුන් ඉදිරිපත් කළ එක් වෙළඳ සැලකට රුපියල් ලක්ෂ 10ක් වැනි අවම වටිනාකමින් යුත් ටෙන්ඩර්පත් පිළිගෙන ඇති බවත්;

(iv) විනිවිදභාවයින් තොරව සිදුකරන ලද ඉහත ටෙන්ඩර් කැඳවීම තුළින් එම ප්‍රාදේශීය සභාවට ලැබිය යුතු විශාල අදායමක් අහිමිවී ඇති බවත්;

(v) එම අයථා ටෙන්ඩර් කැඳවීම තුළින් විශාල මූල්‍යමය වංචාවක් සිදුවී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත ටෙන්ඩර් කැඳවීම සම්බන්ධයෙන් අපක්ෂපාතී පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2042/'11

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2010 වර්ෂයේදී,

(i) සමෘද්ධි වැඩසටහන යටතේ සමෘද්ධි සහනාධාරය ලබාදීම සඳහා වැයකළ මුදල;

(ii) මුළු රටේම සමෘද්ධි සහනාධාරය ලැබූ පවුල් සංඛ්‍යාව;

(iii) සමෘද්ධි ව්‍යාපාරයේ නියාමකවරුන් ලෙස සේවය කළ සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාව;

(iv) සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ගේ වැටුප් සහ දීමනා ගෙවීම වෙනුවෙන් වැය කළ මුදල;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2057/'11

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය වර්ෂ දෙක තුළදී සේවක අර්ථසාධක අරමුදල විසින් කොළඹ කොටස් වෙළඳපොලේ සිදුකරන ලද සියළුම ලැයිස්තුගත කොටස් මිලදී ගැනීම් හා විකිණීම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එක් එක් ගනුදෙනුව සඳහා වගකීම දැරූ තැරැව්කරුවන්ගේ නම් කවරේද;

(iii) තැරැව්කරු ගාස්තු ද ඇතුළුව එක් එක් ගනුදෙනුවට අදාළ පිරිවැය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉහත සඳහන් වර්ෂ දෙකක කාල පරිච්ඡේදය සඳහා එක් එක් කොටස් තැරැව්කාර සමාගමට ගෙවන ලද තැරැව්කාර ගාස්තු ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එක් එක් මිලදී ගැනීමට හෝ විකිණීමට සති දෙකකට පෙර සහ මිලදී ගැනීමෙන් හෝ විකිණීමෙන් සති දෙකකට පසු ඉහත (අ) (i) හි සඳහන් එක් එක් කොටසෙහි ඇවුරුම් මිල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2066/'11

ගරු ඒ. විනායගමූර්ති මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වව්නියාවේ, තච්චන්කුලම්හි පිහිටි බස්තියම් පිල්ලේ ජෝසප් පීටර් මහතාට අයත් අක්කර දහයක වපසරියක් ඇති "පීටර්ස් ෆාම්" නැමති ගොවිපල [අංක 7 එස්. පී. 4739 දරන පිඹුරේ ලොට් අංක 797 ලෙස සඳහන් වන], වව්නියා ගුවන්තොටුපළ පුළුල් කිරීම සඳහා 1986දී අත්පත් කරගත් බවත්;

(ii) 1986දී අත්පත් කරගත් එම ඉඩම සඳහා ගෙවිය යුතු වන්දි මුදල මේ දක්වා ගෙවා නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) බස්තියම් පිල්ලේ මහතා මියගොස් ඇති බැවින් ඉහතකී වන්දි මුදල ඔහුගේ බිරිඳ සහ දියණිය වෙත ගෙවීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2012 පෙබරවාරි මස 21 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1405/'11

ගරු රවී කරුණානායක මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උපායමාර්ගික සංවර්ධන ව්‍යාපෘති පනත් කෙටුම්පත ඉදිරිපත් කර බලාත්මක කරන ලද කාල වකවානුව කවරේද යන්න;

(ii) එකී පනත යටතේ ක්‍රියාත්මක කර ඇති ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද යන්න;

(iii) එම ව්‍යාපෘති සහ ඒවා ආරම්භ කළ රටවල නම් වෙන් වෙන් වශයෙන් කවරේද යන්න සමග ආයෝජනයේ වටිනාකම, රැකියා ධාරිතාව සහ එම ව්‍යාපෘති මගින් සිදුකරන නිෂ්පාදනය හෝ සපයන සේවාව කවරේද යන්න;

(iv) ව්‍යාපෘතිය ආරම්භ කළ වර්ෂයේ සිට, වාර්ෂික පිරිවැටුම සහ එක් එක් ආයෝජකයා විසින් වර්ෂයකට ගෙවිය යුතු බදු ප්‍රමාණය කොපමණද යන්න වෙන් වෙන් වශයෙන්;

එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත, 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත, 2002 අංක 11 දරන මුදල් පනත, 2005 අංක 5 දරන මුදල් පනත, 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත, 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත, 2002 අංක 16 දරන හර බදු පනත සහ රේගු ආඥා පනත (235 වැනි අධිකාරය) අනුව ඉහත සඳහන් පනත මගින් රජය විසින් ප්‍රදානය කර ඇති බදු නිදහස් කිරීම් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1494/'11

ගරු අජිත් කුමාර මහතා,— සමාජ සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සමාජ සේවා අමාත්‍යාංශයේ මේ වනවිට සේවය කරන උපදේශකයින් සංඛ්‍යාව;

(ii) ඔවුන්ගේ නම්, අධ්‍යාපන සුදුසුකම් සහ වගකීම්;

(iii) ඔවුන් වෙත ගෙවනු ලබන වැටුප් සහ දීමනා;

(iv) පසුගිය මාසය සඳහා ගෙවන ලද සියලු දීමනාවල එකතුව;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නිලරථ ලබාදී ඇති උපදේශකයින්ගේ නම්, ලබාදී ඇති නිලරථ සංඛ්‍යාව සහ ඒවායේ විස්තර කවරේද;

(ii) ඔවුන් වෙත ඉන්ධන දීමනා ලබාදෙන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබාදෙන ඉන්ධන දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඔවුන් වෙත දුරකථන පහසුකම් ලබා දෙන්නේ නම්, මේ වන විට දුරකථන පහසුකම් ලබා දී ඇති උපදේශකයන්ගේ නම් කවරේද;

(ii) දුරකථන දීමනාවක් ගෙවන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබා දී ඇති දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1568/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කළමනාකරණ සහකාර සේවයේ අධි පන්තියේ නිලධාරීන් ඇතුළු තවත් සේවාවන් අධීක්ෂක නිලධාරීන් කුසලතා මත උසස් කිරීම මගින් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තියේ II ශ්‍රේණියට පත් කිරීම සඳහා පැවති තරඟ විභාගය 2007 වර්ෂයෙන් පසු අහෝසිකර තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම තරඟ විභාගය අහෝසි කිරීම නිසා,

(i) කුසලතා මත ඉහළ ශ්‍රේණියකට යාමට තිබූ එකම අවස්ථාව එම නිලධාරීන්ට අහිමිවන බවත්;

(ii) කළමනාකරණ සහකාර අධි පන්තියේ නිලධාරීන් ඇතුළු අදාළ සේවාවන් රැසක නිලධාරීන් දැඩි කලකිරීමට පත්ව ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) එම තරඟ විභාගය අහෝසි කිරීමට බලපෑ හේතු සාධක කවරේද;

(ii) එය නැවත ආරම්භ කිරීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1592/'11

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) හම්බන්තොට, රන්මිණිතැන්න ටෙලි ගම්මානය ඉදිකිරීමට දරන ලද මුළු වියදම කොපමණද;

(ii) දැනට එම ගම්මානය යොදා ගනිමින් නිමකර ඇති නිර්මාණ සංඛ්‍යාව කොපමණද;

(iii) එම ගම්මානය නිර්මාණ කටයුතු සඳහා කලාකරුවන්ට ලබා දීමේදී මුදල් අයකරනු ලබන්නේද;

(iv) එසේ නම්, මේ වනවිට එමගින් උපයා ඇති ආදායම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) රන්මිණිතැන්න ගම්මානයේ නඩත්තු කටයුතු සඳහා සිටින සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) එහි පරිපාලනය හා නඩත්තුව සඳහා මාසිකව වැයවන මුදල කොපමණද;

(iii) මෙම ගම්මානය පරිහරණයේදී ආර්ථික දුෂ්කරතා සහිත කලාකරුවන්ට ලබා දෙන විශේෂ සහන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1661/'11

ගරු ඊ. සරවනපවන් මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) යාපනය දිස්ත්‍රික්කයේ, නාගර් කෝවිල් ප්‍රදේශයේ සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කොට තිබේද;

(ii) එසේ නම්, එම සංවර්ධන ව්‍යාපෘති මගින් ප්‍රතිලාභ ලබන සංඛ්‍යාව කොපමණද;

(iii) 2010 වර්ෂය සඳහා වූ ආර්ථික ප්‍රගති වාර්තාව අනුව නාගර් කෝවිල් වෙළඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා වෙන්කළ රුපියල් මිලියන 5.8 ට සිදුවූයේ කුමක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1667/'11

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) නිදහසින් පසු ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වූ විදේශීය ගුවන් විදුලි සේවාවන් කවරේද;

(ii) ඒවායින් මෙරටට ඇති වූ බලපෑම් කවරේද;

(iii) එම ගුවන් විදුලි සේවාවන් ඉවත් කිරීම සඳහා කටයුතු කරනු ලැබුවේද;

(iv) එසේ නම්, ඒ සඳහා ක්‍රියාත්මක වූ රජය කුමක්ද;

(v) එම ක්‍රියාමාර්ග ගනු ලැබූ වර්ෂයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉදිරියේදී විදේශීය ගුවන් විදුලි සේවාවන් ශ්‍රී ලංකාව තුළ පවත්වාගෙන යාම සඳහා අනුමතිය ලබා දෙන්නේද;

(ii) එසේ නම්, එම අනුමතිය ලබා දෙන පදනම කවරේද;

(iii) එවැනි පදනමක පිහිටුවා කටයුතු කිරීමෙන් ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1672/'11

ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2006 වර්ෂයේ සිට මේ දක්වා වූ කාලය තුළ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ගයන් කවරේද;

(ii) මෙම ක්‍රියාමාර්ග හරහා උසස් අධ්‍යාපනය ලබන සිසු සිසුවියන්ට ලැබුණු ප්‍රතිලාභ කවරේද;

(iii) උසස් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සම්බන්ධයෙන් ඉදිරියේදී ගැනීමට බලාපොරොත්තු වන ක්‍රියාමාර්ග කවරේද;

(iv) එමගින් අපේක්ෂිත ප්‍රතිඵල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1683/'11

ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා,— සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2006 වර්ෂයේ සිට මේ දක්වා කාල සීමාව තුළ සිවිල් ගුවන්සේවා ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘතීන් කවරේද;

(ii) එම ව්‍යාපෘතින් හරහා ජනතාවට ලැබී ඇති ප්‍රතිලාභ කවරේද;

(iii) ඉදිරියේදී සිවිල් ගුවන්සේවා ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන ව්‍යාපෘතීන් කවරේද;

(iv) ඒවායින් අපේක්ෂිත ප්‍රතිඵල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1695/'11

ගරු අනුර දිසානායක මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරේ දුම්රිය මාර්ග නැවත ගොඩනැගීම වෙනුවෙන් ක්‍රියාත්මක කළ උතුරු මිතුරු ව්‍යාපෘතියේ කටයුතු සඳහා ප්‍රවාහන අමාත්‍යාංශය මැදිහත් වූයේද;

(ii) එම ව්‍යාපෘතියේ අරමුණ කවරේද;

(iii) එම ව්‍යාපෘතියට අදාළව ඉටු කිරීමට තිබූ කර්තව්‍යයන් කවරේද;

(iv) ඒ සඳහා අවශ්‍ය මුදල් සපයා ගන්නා ආකාරය කවරේද;

(v) උතුරේ දුම්රිය මාර්ග ව්‍යාපෘතිය යටතේ මේ වන විට ඉටු කර ඇති වැඩ කොටස් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම් ඒ මන්ද?

1721/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශයට අයත් ව්‍යවස්ථාපිත මණ්ඩල හා සංස්ථා වෙනුවෙන් පත්කොට ඇති උප සභාපතිවරු කවුරුන්ද;

(ii) එම උප සභාපතිවරු පත්කරන ලද බලධාරියා කවුරුන්ද;

(iii) උප සභාපතිවරුන්ගේ අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය පළපුරුද්ද කවරේද;

(iv) එම එක් එක් උප සභාපතිවරයා වෙනුවෙන් ගෙවනු ලබන වැටුප් හෝ දීමනා, ලබා දී ඇති වාහන, දුරකතන ඇතුළු පහසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1875/'11

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුලියාපිටිය මූලික රෝහලේ රථගාල පාලනය සඳහා සුදුස්සන් තෝරා ගැනීමට පිලිගත් ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය කරන්නේද;

(ii) එසේ නම්, එම ටෙන්ඩරය පිරිනැමීමට අදාළ කොන්දේසි කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) රෝහල් රථගාලේ පාලනය ලබාගෙන ඇති ටෙන්ඩර්කරු විසින් යතුරු පැදියක් ගාල් කිරීම වෙනුවෙන් අයකරන ගාස්තුව කොපමණද;

(ii) රථගාලේ මුදල් අයකිරීම වෙනුවෙන් පිලිගත් මුදල් භාර ගැනීමේ රිසිට්පතක් නිකුත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබා ගන්නා රෝගියෙකු බැලීම සඳහා රථයකින් දිනකට තුන් වරක් රෝහලට පැමිණෙන පුද්ගලයෙකුගෙන් වාර තුනකදී එකම කාර්යය සඳහා මුදල් අය කිරීම සාධාරණ නොවන බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1916/'11

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇති පාසල් අතරින් "ද්විතියික පාසල් 1000" ව්‍යාපෘතිය සඳහා තෝරාගෙන ඇති පාසල් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ක/දොඹගොඩ සීලරතන මහා විද්‍යාල "ද්විතියික පාසල් 1000" ව්‍යාපෘතිය සඳහා තෝරාගැනීමට සුදුසු බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එසේ නම්, එම පාසල එකී ව්‍යාපෘතිය සඳහා ඇතුළත් කර ගැනීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1991/'11

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 'වයස අවුරුදු 21ට අඩු පුද්ගලයින්ට දුම්වැටි අලෙවි කිරීම රජය තහනම් කර ඇත' යනුවෙන් දැනුවත් කිරීමේ දැන්වීම් ව්‍යාපාරික ස්ථාන හා භෝජනාගාරවල ප්‍රදර්ශනයට තබා ඇති බවත්;

(ii) එසේ වුවද මන්නාරම් ප්‍රදේශයේ ව්‍යාපාරික ස්ථාන හා භෝජනාගාරවල වයස අවුරුදු 18න් පහළ පුද්ගලයින්ට දුම්වැටි අලෙවි කිරීම පිළිබඳව පැමිණිලි ලැබී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මේ පිළිබඳව එම ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාගේ අවධානය යොමුකර, නීතිමය පියවර ගන්නා ලෙස අදාළ පළාත් පාලන ආයතනයට දැන්වීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2046/'11

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගොවිජන කේන්ද්‍රයකින් ගොවි ජනතාවට ඉටු කරන සේවාවන් කවරේද;

(ii) සෑම ගොවිජන කේන්ද්‍රයක් තුළම ගොවිජන බැංකු ස්ථාපනය කොට තිබේද;

(iii) 2010 වර්ෂය තුළ ගොවිජන බැංකු හරහා ගොවීන්ට ලබා දී ඇති ණය ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2058/’11

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) සේවක අර්ථසාධක අරමුදලේ කළමනාකරණ කටයුතු ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් සිදු කෙරෙන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මුදල් මණ්ඩලයේ අනුමතිය ඇතිව, ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුකූලව ආයෝජන කමිටුවේ මෙහෙයවීම අනුව සේවක අර්ථසාධක අරමුදලේ කළමනාකරණය සිදු කරන්නේද;

(ii) සේවක අර්ථසාධක අරමුදලේ, අරමුදල් කළමනාකරණ අංශය විසින් ඉදිරිපත් කෙරෙන ආයෝජන යෝජනා ඇගැයීම සඳහා ආයෝජන කමිටුව නියමිත පරිදි, අඛණ්ඩව රැස්වන්නේද;

(iii) සේවක අර්ථසාධක අරමුදලේ ආයෝජන ප්‍රතිපත්තියට අනුකූලව ආයෝජන තීරණ ගනු ලබන්නේද;

(iv) පසුගිය වර්ෂ දෙක සඳහා ආයෝජන කමිටු රැස්වීම්වල කාර්ය සටහන් සභාගත කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) පසුගිය වර්ෂ දෙකක කාලය තුළදී, ආයෝජන කමිටුවේ;

(i) සියලුම සාමාජිකයන්ගේ නම් සහ පත්වීම් දිනයන් කවරේද; සහ

(ii) රැස්වීම් පවත්වන ලද දින හා සහභාගී වූ සාමාජිකයන්ගේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2012 පෙබරවාරි මස 22 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1410/’11

ගරු රවී කරුණානායක මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජය හා පෞද්ගලික අංශය සතු දැනට ක්‍රියාත්මක සියලුම වරායන්ගේ නම් කවරේද;

(ii) රජය හා පෞද්ගලික අංශය මගින් ක්‍රියාත්මක කිරීමට නියමිත ශ්‍රී ලංකාවේ වරායන්ගේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) බහලු සහ අනෙකුත් නැව් භාණ්ඩ සම්බන්ධයෙන් සියලුම වරායන්ගේ පූර්ණ ක්‍රියාකාරී ධාරිතාව කොපමණද;

(ii) එක් එක් වරායේ තථ්‍ය මෙහෙයුම් ධාරිතාව එහි පූර්ණ ධාරිතාවේ ප්‍රතිශතයක් වශයෙන් කොපමණද;

(iii) වරායන්ගේ අතිරික්ත ධාරිතාවන් මෙහෙයවන ආකාරය කවරේද;

යන්න එතුමා වෙන් වෙන් වශයෙන් මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත අ (i) හි සඳහන් එක් එක් වරායේ සේවක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඔවුන්ට අවසන් වශයෙන් ගෙවූ වැටුප් හා වේතනවල එකතුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1498/'11

ගරු අජිත් කුමාර මහතා,— රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ මේ වනවිට සේවය කරන උපදේශකයින් සංඛ්‍යාව;

(ii) ඔවුන්ගේ නම්, අධ්‍යාපන සුදුසුකම් සහ වගකීම්;

(iii) ඔවුන් වෙත ගෙවනු ලබන වැටුප් සහ දීමනා;

(iv) පසුගිය මාසය සඳහා ගෙවන ලද සියලු දීමනාවල එකතුව;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නිලරථ ලබාදී ඇති උපදේශකයින්ගේ නම්, ලබාදී ඇති නිලරථ සංඛ්‍යාව සහ ඒවායේ විස්තර කවරේද;

(ii) ඔවුන් වෙත ඉන්ධන දීමනා ලබාදෙන්නේ නම් එක් එක් උපදේශකවරයාට ලබාදෙන ඉන්ධන දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඔවුන් වෙත දුරකථන පහසුකම් ලබා දෙන්නේ නම්, මේ වන විට දුරකථන පහසුකම් ලබා දී ඇති උපදේශකයන්ගේ නම් කවරේද;

(ii) දුරකථන දීමනාවක් ගෙවන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබා දී ඇති දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1570/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, දෙනියාය කලාප අධ්‍යාපන කාර්යාලය මගින් පාලනය වන මාර/කළුබෝවිටියන මහ විදුහලේ ගොඩනැගිලි කිහිපයක් දැඩි ලෙස අබලන්ව ඇති බවත්;

(ii) එම පාසලේ සිසු දරුවන් එම අබලන් ගොඩනැගිලි තුළ දැඩි අවදානම් තත්වයක් යටතේ අධ්‍යාපන කටයුතුවල යෙදෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ගොඩනැගිලි අලුත්වැඩියා කිරීමට කටයුතු කරන්නේද;

(ii) ඊට අවශ්‍ය ප්‍රතිපාදන මේ වන විට වෙන්කර තිබේද;

(iii) එසේ නම්, එම මුදල කොපමණද ;

(iv) ප්‍රතිපාදන වෙන්කර තිබේ නම්, එහි අලුත්වැඩියා කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1674/'11

ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2006 වර්ෂයේ සිට මේ දක්වා කාල සීමාව තුළ කර්මාන්ත ක්ෂේත්‍රයේ ඇති කරන ලද සංවර්ධන ව්‍යාපෘතීන් කවරේද;

(ii) මෙම ව්‍යාපෘතීන් හරහා ජනතාවට ලැබී ඇති ප්‍රතිලාභ කවරේද;

(iii) එම ක්ෂේත්‍රයේ ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන ව්‍යාපෘතීන් කවරේද;

(iv) ඒවායින් අපේක්ෂිත ප්‍රතිඵල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1684/'11

ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2006 වර්ෂයේ සිට මේ දක්වා කාල සීමාව තුළ ඉඩම් ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘතීන් කවරේද;

(ii) එම ව්‍යාපෘතීන් හරහා ජනතාවට ලැබී ඇති ප්‍රතිලාභ කවරේද;

(iii) ඉදිරියේදී ඉඩම් ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන ව්‍යාපෘතීන් කවරේද;

(iv) ඒවායින් අපේක්ෂිත ප්‍රතිඵල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1690/'11

ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමි,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2006 වර්ෂයේ සිට මේ දක්වා කාල සීමාව තුළ පරිසරය සුරැකීම සඳහා ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන් කවරේද;

(ii) එම ව්‍යාපෘතීන් හරහා ජනතාවට ලැබී ඇති ප්‍රතිලාභ කවරේද;

(iii) පරිසරය ආරක්ෂා කර ගැනීම සඳහා ඉදිරියේදී ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iv) එමගින් අපේක්ෂිත ප්‍රතිඵල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1696/'11

ගරු අනුර දිසානායක මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) තාන්ඩිකුලම් සිට ඕමන්තේ දක්වා දුම්රිය මාර්ගයේ දිග කිලෝමීටර් කොපමණද;

(ii) එම දුම්රිය මාර්ගය පිළිසකර කරනු ලබන සමාගම කවරේද;

(iii) එම මාර්ග පිළිසකර කටයුතු සඳහා ඇස්තමේන්තු කළ මුදල කොපමණද;

(iv) ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1722/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශයේ හෝ එම අමාත්‍යාංශයට අදාළ ආයතනයන් මගින් හෝ ජාතික නිවාස ගීතයක් නිර්මාණයකර තිබේද;

(ii) එම ගීතයේ පද රචනය, තනු නිර්මාණය, සංගීතය, ගායනය හා රූප රචනය කරන ලද ශිල්පීන් කවුරුන්ද;

(iii) එම ගීතය නිර්මාණය වෙනුවෙන් වැය වූ මුළු මුදල කොපමණද;

(iv) එම මුදල් වැය කරන ලද වැය ශීර්ෂය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1909/'11

ගරු රන්ජන් රාමනායක මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) විදේශ රැකියා සඳහා මැද පෙරදිග රටවලට යන බොහෝ ශ්‍රමිකයන්ට එම රටවල ක්‍රියාත්මක වන ෂරියා නීතිය සහ අනෙකුත් නීති රීති පිළිබඳව දැනුවත්භාවයක් නොමැති බවත්;

(ii) එම හේතුව නිසා විදේශ රැකියාවල යෙදීමේදී ඔවුන්ට විවිධ ගැටලුවලට මුහුණ පෑමට සිදුවී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මැදපෙරදිග රටවල නීති රීති පිළිබඳ නොදැනුවත්කම හේතුවෙන් එම රටවල නීතිය යටතේ වරදකරුවන් වන ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්හට නීති ආධාර ලබා ගැනීමේ වැඩපිළිවෙළක් තිබේද;

(ii) නොඑසේ නම්, එවැනි වැඩපිළිවෙළක් හඳුන්වා දී එම ශ්‍රමිකයන්ට ඇතිවන ගැටලු මගහැරවීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එවැනි වැඩපිළිවෙළක් හඳුන්වා දෙන දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1917/'11

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇති පාසල් අතරින් "ද්විතියික පාසල් 1000" ව්‍යාපෘතිය සඳහා තෝරාගෙන ඇති පාසල් කවරේද;

(ii) ක/වැව්ට මෛත්‍රී මහා විද්‍යාලය "ද්විතියික පාසල් 1000" ව්‍යාපෘතිය සඳහා තෝරාගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1992/'11

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යාපනය, වඩමරච්චි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මනල්කාඩුහි පදිංචි ජනතාවට මෙතෙක් විදුලිබල පහසුකම් ලබා දී නොමැති බවත්;

(ii) මේ පිළිබඳව යාපනය දිස්ත්‍රික් ලේකම්වරයාට, වඩමරච්චි ප්‍රාදේශීය ලේකම්වරයාට හා ලංකා විදුලිබල මණ්ඩලයට එම ප්‍රදේශයේ ජනතාව විසින් පෙත්සම් ඉදිරිපත්කර ඇති බවත්;

(iii) එම ප්‍රදේශයට විදුලිය ලබා දෙනු පිණිස විදුලි කණු සිටුවා මාස 4කට වඩා ගතවී ඇතත්, මෙතෙක් විදුලි රැහැන් සම්බන්ධකොට නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, මනල්කාඩු ප්‍රදේශවාසීන්ගේ යහපත උදෙසා ඔවුනට විදුලි පහසුකම් ලබාදීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2002/’11

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පුත්තලම කල්පිටිය මාර්ගයේ, 7 වැනි සහ 9 වැනි කණු අතර මහා මාර්ගය හා පුත්තලම කලපුව අතර පිහිටි බිම් තීරුවේ වූ කඩොලාන රෝපණය කිසියම් පිරිසක් විසින් විනාශ කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම කඩොලාන රෝපණය පිහිටි බිම් තීරුව කිසියම් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා භාවිතා කරන්නේද;

(ii) එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන අය කවුරුන්ද;

(iii) එම ව්‍යාපෘතියට අයත් බිම් තීරුවේ වර්ග ප්‍රමාණය කොපමණද;

(iv) එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ලබාගෙන ඇති නීතිමය ප්‍රතිපාදන කවරේද;

(v) වයඹ පළාත් පාරිසරික අණ පනත්වලට අනුව එම ව්‍යාපෘතිය සඳහා පූර්ව පාරිසරික ඇගයීම් වාර්තාවක් ලබා ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2048/’11

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරු පළාත් ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල යටතේ ඇති පවුල් සෞඛ්‍ය සේවා කොට්ඨාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම පවුල් සෞඛ්‍ය සේවා කොට්ඨාස සියල්ලම සඳහා පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන් පත්කිරීමට කටයුතු කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2059/’11

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නුගේගොඩ පැරණි ජනතා පොළ කඩාබිඳ දැමූ අවස්ථාවේදී එහි වෙළෙඳුන් ඉවත්කිරීම සඳහා සහ ඉන් අනතුරුව 2011 ඔක්තෝබර් මස පළමුවැනි සතියේදී අලුතින් සංවර්ධනය කරන ලද ජනතා පොළේ වෙළඳසැල් ලබාදීම පිණිස වෙළෙඳුන් තෝරා ගැනීම සඳහා අනුගමනය කරන ලද සම්පූර්ණ ක්‍රියාපටිපාටිය කවරේද;

(ii) වෙළෙඳුන් ඉවත් කිරීමට සහ වෙළඳසැල් වෙන්කර දීමට අදාළ එක් එක් ක්‍රියාකාරකම වෙනුවෙන් වගකීම දැරූ පුද්ගලයන්ගේ නම් කවරේද;

(iii) වෙළෙඳුන් ඉවත් කිරීම සහ වෙළඳසැල් වෙන්කර දීම සඳහා එක් එක් ක්‍රියාමාර්ගය ක්‍රියාත්මක කළ දිනයන් කවරේද;

(iv) (අ) (i) හි සඳහන් පරිදි ඉවත් කරන ලද වෙළෙඳුන්ගේ සංඛ්‍යාව, නම් සහ ලිපිනයන් සහ වෙළඳසැල් ලබාදෙන ලද වෙළඳුන්ගේ එම තොරතුරු වෙළඳසැල්වල ප්‍රමාණය, ඉදිකරන ලද වෙළඳසැල් හා ඉදිකිරීම්වලින් තොරව බිම්කඩ සලකුණු කිරීමෙන් ලබාදුන් වෙළඳාම් කිරීමේ ස්ථාන අනුව කවරේද;

යන්න එතුමා වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉවත් කරන ලද හා නැවත වෙළඳසැල් ලබාදෙන ලද වෙළෙඳුන්ගේ ලැයිස්තු දෙක අතර යම් විෂමතාවක් පවතින්නේද;

(ii) එසේ නම්, එම විෂමතාව ඉවත් කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1411/’11

ගරු රවී කරුණානායක මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලක් සතොස ආයතනය ආරම්භ කල අවස්ථාවේ එහි අධ්‍යක්ෂවරුන්ගේ නම් කවරේද;

(ii) වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලයේ නම් කවරේද;

(iii) මුදල් අමාත්‍යාංශය නියෝජනය කරන අධ්‍යක්ෂවරුන්ගේ නම් කවරේද;

(iv) ලක් සතොස ආයතනයේ විගණන නිලධාරීන්ගේ සහ සමාගම් ලේකම්වරුන්ගේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ආරම්භයේ සිට මේ දක්වා වූ කාලය තුළ ලක් සතොස ආයතනයේ වාර්ෂික මහා රැස්වීම් පැවැත්වූ දිනයන් කවරේද යන්න එතුමා මේ සභාවට දන්වන්නෙහිද?

(ඇ) වෙනත් සුපිරි වෙළඳසල් හා සංසන්දනය කිරීමේදී ලක් සතොස ආයතනයේ වෙළඳපොළ කොටස කොපමණදැයි එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2012 පෙබරවාරි මස 23 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1412/’11

ගරු රවී කරුණානායක මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ආයෝජන මණ්ඩලය තවමත් රටට ඇදී එන විදේශ ආයෝජන සම්බන්ධව කටයුතු කරන එකම ආයතනය වන්නේද;

(ii) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 16 වැනි හා 17 වැනි වගන්ති කවරේද;

(iii) 16 වැනි සහ 17 වැනි වගන්ති හැර වෙනත් නිර්ණායක තිබේද; සහ

(iv) ආයෝජන අයදුම්පතකට අනුමතිය ලබාදීමට ගතවන කාලසීමාව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) වර්තමාන ආයෝජන මණ්ඩලයෙහි සංයුතිය කවරේද; සහ

(ii) ආයෝජන තක්සේරු කිරීම්, අනුමත කිරීම් සහ ආයෝජන අධීක්ෂණය කිරීම් වැනි කටයුතු ඉටුකරන ප්‍රධාන පුද්ගලයින්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ආයෝජන මණ්ඩලය හරහා සැබැවින්ම රටට පැමිණි ආයෝජන කවරේද;

(ii) ඒවා අතුරින් යටිතල පහසුකම් සංවර්ධනයට අදාළ ආයෝජන කවරේද;

(iii) ආයෝජන මණ්ඩලයට එවන ලද ආයෝජන අයදුම්පත් කවරේද;

(iv) ආයෝජන මණ්ඩල පනතේ 16 වැනි හා 17 වැනි වගන්ති යටතේ ඇති කිරීමට බලාපොරොත්තු වන ආයෝජනවල සහ රැකියා අවස්ථාවල වටිනාකම කොපමණද;

යන්න 2000-2004, 2005-2009, 2010 වර්ෂය සහ 2011 වර්ෂයේ සිට අද දක්වා වශයෙන් වන කාල සීමාවන් සඳහා වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1499/'11

ගරු අජිත් කුමාර මහතා,— යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ මේ වනවිට සේවය කරන උපදේශකයින් සංඛ්‍යාව;

(ii) ඔවුන්ගේ නම්, අධ්‍යාපන සුදුසුකම් සහ වගකීම්;

(iii) ඔවුන් වෙත ගෙවනු ලබන වැටුප් සහ දීමනා;

(iv) පසුගිය මාසය සඳහා ගෙවන ලද සියලු දීමනාවල එකතුව;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නිලරථ ලබාදී ඇති උපදේශකයින්ගේ නම්, ලබාදී ඇති නිලරථ සංඛ්‍යාව සහ ඒවායේ විස්තර කවරේද;

(ii) ඔවුන් වෙත ඉන්ධන දීමනා ලබාදෙන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබාදෙන ඉන්ධන දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඔවුන් වෙත දුරකථන පහසුකම් ලබා දෙන්නේ නම්, මේ වන විට දුරකථන පහසුකම් ලබා දී ඇති උපදේශකයන්ගේ නම් කවරේද;

(ii) දුරකථන දීමනාවක් ගෙවන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබා දී ඇති දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1572/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සුනාමියෙන් නිවාස අහිමි වූ පවුල් සඳහා ගාල්ල දිස්ත්‍රික්කයේ, අහංගම තිත්තගල්ල ප්‍රදේශයේ ඉදිකළ සුමිතුරු නිවාස ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන ලබා දුන් අයතනය කවරේද;

(ii) එම ආයතනය ලබා දුන් මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත ව්‍යාපෘතියේ නිවාස නිසි ප්‍රමිතියට ඉදිකර නොමැති බව එතුමා දන්නෙහිද?

(ඇ) (i) එම නිවාස නිසි ප්‍රමිතියට අනුව ඉදිකර දීමට එතුමා පියවර ගන්නේද;

(ii) එසේ නම්, ඊට ගතවන කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1675/'11

ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2006 වර්ෂයේ සිට මේ දක්වා කාලය තුළ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘතීන් කවරේද;

(ii) එම ව්‍යාපෘතීන් හරහා ජනතාවට ලැබී ඇති ප්‍රතිලාභ කවරේද;

(iii) ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන ව්‍යාපෘතීන් කවරේද;

(iv) ඒවායින් අපේක්ෂිත ප්‍රතිඵල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1724/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා මහ බැංකුවේ ඉන්ඩස්ට්‍රියල් ෆිනෑන්ස් ලිමිටඩ් (Industrial Finance Limited) යන නමින් බැංකු නොවන මූල්‍ය ආයතනයක් ලියාපදිංචිකර තිබේද;

(ii) එය ලියාපදිංචිකළ දිනය කවරේද;

(iii) එහි සභාපතිවරයාගේ හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ නම්, ලිපිනයන් හා මූල්‍ය ක්ෂේත්‍රය තුළ ඔවුන්ගේ පළපුරුද්ද වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මෙම සමාගම මීට පෙර වෙනත් සමාගමකට අයිතිව තිබුනේද;

(ii) එසේ නම්, එම සමාගමේ නම කවරේද;

(iii) එහි සභාපතිවරයා හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) I.F.L සමාගමේ දැනට සිටින ගනුදෙනුකරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) එහි මුදල් තැන්පත්කළ තැන්පත්කරුවන් සංඛ්‍යාව කෙපමණද;

(iii) 2011 මාර්තු 31 වැනි දිනට එම සමාගම සතුව තිබූ තැන්පතුවල වටිනාකම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1687/'11

ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2006 වර්ෂයේ සිට මේ දක්වා කාල සීමාව තුළ වැවිලි ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘතීන් කවරේද;

(ii) එම ව්‍යාපෘතීන් හරහා ජනතාවට ලැබී ඇති ප්‍රතිලාභ කවරේද;

(iii) ඉදිරියේදී වැවිලි ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන ව්‍යාපෘතීන් කවරේද;

(iv) ඒවායින් අපේක්ෂිත ප්‍රතිඵල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1728/'11

ගරු අනුර දිසානායක මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දික්ඕවිට ධීවර වරාය ඉදිකිරීම නිසා නිවාස අහිමි වූ සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ට වන්දි මුදල් ලබා දුන්නේද;

(iii) එසේ නම්, එක් එක් අය වෙනුවෙන් ලබා දුන් වන්දි මුදල් වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම ධීවර වරාය ඉදිකිරීමේදී නිවාස අහිමිවූවන් සඳහා නිවාස ඉදිකර දී තිබේද;

(ii) එසේ නම්, එම නිවාස ඉදිකරනු ලැබූ සමාගම කවරේද;

(iii) එම සමාගම තෝරාගත් ක්‍රමවේදය කවරේද;

(iv) එක් එක් නිවාසයේ ඉඩ ප්‍රමාණය හා ඉදිකිරීම සඳහා වැය කළ මුදල කොපමණද;

(v) ඉදිකරන ලද නිවාස පුපුරායෑම් හා ගිලා බැසීම්වලට ලක්ව තිබේද;

(vi) එසේ නම්, එම තත්වයන් නිවැරදි කිරීම සඳහා යොදන පිළියම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1918/'11

ගරු අජිත් පී. පෙරේරා මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) බණ්ඩාරගම විවිධසේවා සමූපකාර සමිතියෙන් සහ එයට අනුබද්ධිත සමූපාකාර ග්‍රාමීය බැංකුවෙන් ණය ලබාගෙන, 2011.05.01 දින වන විට එම ණය ගෙවීම පැහැර හැර ඇති අයගේ නම් සහ එක් එක් තැනැත්තා විසින් ගෙවා නොමැති මුදල වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ගෙවීම් පැහැර හරින ලද ඉහත ණය මුදල් ආපසු අය කර ගැනීම සඳහා බණ්ඩාරගම විවිධ සේවා සමූපකාර සමිතිය විසින් ගෙන ඇති පියවර කවරේද;

(ii) එසේ පියවර නොගන්නේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2003/'11

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) විල්පත්තුව ජාතික වනෝද්‍යානයේ ප්‍රේරක කලාපය තුළ කලා ඔය ආශ්‍රිතව, මොරඩවිල්ලුව හා තවුසමඩම ප්‍රදේශයේ පිහිටි වනාන්තර අක්කර ගණනාවක් හෙළි කර කෘෂිකාර්මික ව්‍යාපෘති සඳහා ලබාදීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ව්‍යාපෘතිය සඳහා හෙළි පෙහෙළි කර ඇති භූමිය අයත් දිස්ත්‍රික්කය සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය කුමක්ද;

(ii) මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන අය කවුරුන්ද;

(iii) එම ව්‍යාපෘතිය සඳහා වනාන්තරය ආශ්‍රිතව හෙළි පෙහෙළි කර ඇති භූමි ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) එවැනි ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන ලබා ගෙන තිබේද;

(ii) එසේ නම්, ඒ කවරේද;

(iii) හෙක්ටයාර එකකට වඩා වැඩි බිමක් හෙළි පෙහෙළි කර සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට පෙර පරිසර බලපෑම් ඇගයීම් ක්‍රියාවලියට යටත්ව ගත යුතු පූර්ව පාරිසරික අනුමතිය මෙම ව්‍යාපෘතිය සඳහා ලබා ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2010/’11

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නුවරඑළිය දිස්ත්‍රික්කයේ, හඟුරන්කෙත ප්‍රදේශයේ, “ජන සෙවන” නිවාස ගම්මාන ඉදිකිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මකවේද;

(ii) එසේ නම්, ඒ යටතේ ඉදිකරනු ලබන නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) එම ඉදිකිරීම් කටයුතු අවසාන කිරීමට අපේක්ෂිත වර්ෂය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2049/’11

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරු පළාතේ ඇති සියලුම පවුල් සෞඛ්‍ය සේවා කොට්ඨාස තුළ සෞඛ්‍ය මධ්‍යස්ථාන ඉදිවී තිබේද;

(ii) නොඑසේ නම්, සෞඛ්‍ය මධ්‍යස්ථාන නොමැති පවුල් සෞඛ්‍ය කොට්ඨාස සංඛ්‍යාව කොපමණද;

(iii) එම කොට්ඨාසවල නම් කවරේද;

(iv) දැනට සෞඛ්‍ය මධ්‍යස්ථාන නොමැති කොට්ඨාසවලට සෞඛ්‍ය මධ්‍යස්ථාන ලබාදීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1413/’11

ගරු රවි කරුණානායක මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2009, 2010 සහ 2011 වර්ෂ සඳහා වෙන් වෙන් වශයෙන්, එක් එක් රට මගින් ලංකාවේ සිදුකරන ලද මුළු ආයෝජන ප්‍රමාණය කොපමණද;

(ii) එම ආයෝජන තුළින් රටේ ඇතිවූ රැකියා සංඛ්‍යාව එක් එක් රට සහ සමාගම අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඒවා අතුරින්, තවමත් පවතින රැකියා සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත අ (i)හි සඳහන් ආයෝජනවල සමස්ත අපනයන විභවය කොපමණද;

(ii) 2009, 2010 සහ 2011 වර්ෂවල සිදුවූ සැබෑ අපනයන ප්‍රමාණය එක් එක් රට සහ සමාගම අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) රටවල් සහ සමාගම් අනුව ඉහත අ (i) හි සඳහන් ආයෝජන මගින් ලැබී ඇති සමස්ත එකතු කළ අගය කවරේද;

(ii) ඉහත සඳහන් සමාගම් මගින් ගෙවූ බදු ප්‍රමාණය කවරේද;

යන්න 2009, 2010 සහ 2011 වර්ෂ සඳහා වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1500/'11

ගරු අජිත් කුමාර මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ මේ වනවිට සේවය කරන උපදේශකයින් සංඛ්‍යාව;

(ii) ඔවුන්ගේ නම්, අධ්‍යාපන සුදුසුකම් සහ වගකීම්;

(iii) ඔවුන් වෙත ගෙවනු ලබන වැටුප් සහ දීමනා;

(iv) පසුගිය මාසය සඳහා ගෙවන ලද සියලු දීමනාවල එකතුව;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නිලරථ ලබාදී ඇති උපදේශකයින්ගේ නම්, ලබාදී ඇති නිලරථ සංඛ්‍යාව සහ ඒවායේ විස්තර කවරේද;

(ii) ඔවුන් වෙත ඉන්ධන දීමනා ලබාදෙන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබාදෙන ඉන්ධන දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඔවුන් වෙත දූරකථන පහසුකම් ලබා දෙන්නේ නම්, මේ වන විට දූරකථන පහසුකම් ලබා දී ඇති උපදේශකයන්ගේ නම් කවරේද;

(ii) දූරකථන දීමනාවක් ගෙවන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබා දී ඇති දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1573/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කුරුණෑගල ප්‍රාදේශීය සභාව මගින් දැනට වර්ෂයකට පමණ පෙර ආරම්භ කරන ලද වැල්ලව පොදු ක්‍රීඩාංගණය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය මේ දක්වා නාම පුවරුවකට පමණක් සීමා වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) වැල්ලව පොදු ක්‍රීඩාංගණය සංවර්ධනය කිරීමේ කටයුතු නතර කිරීමට හේතු කවරේද;

(ii) එම ක්‍රීඩාංගණයේ සංවර්ධන කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

(iii) ඒ සඳහා වෙන් කරන ලද මුළු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1809/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කන්තලේ සීනි කර්මාන්ත ශාලාවේ නිෂ්පාදන කටයුතු නැවත ආරම්භ කිරීමට සැලසුම්කර තිබේද;

(ii) එසේ නම්, එහි නිෂ්පාදන කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) කන්තලේ සීනි කර්මාන්ත ශාලාව සතු භූමි ප්‍රමාණය කොපමණද;

(ii) එම භූමි ප්‍රමාණයෙන් විකුණා හෝ බදු දී ඇති භූමි ප්‍රමාණය කොපමණද;

(iii) එම ඉඩම් ලබා දී ඇති කාල සීමාව කොපමණද;

(iv) එම ඉඩම් මිලදී ගත් හෝ බදු වශයෙන් ලබාගත් ආයතන කවරේද;

(v) එම ආයතන අයිති රටවල් කවරේද;

(vi) විකිණීමෙන් හෝ බදු දීමෙන්, එම එක් එක් ආයතනයෙන් ලබාගත් මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2012 පෙබරවාරි මස 24 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1414/'11

ගරු රවි කරුණානායක මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ප්‍රශස්ථ ආයෝජකයකු වෙත ශ්‍රී ලංකාවේ ආයෝජන අවස්ථා හඳුන්වා දීමේදී උපයෝගී කරගන්නා විශේෂිත විකුණුම් උපක්‍රම කවරේද;

(ii) ඉන්දියාව, ඉන්දුනීසියාව, බංග්ලාදේශය, චීනය, වියට්නාමය සහ කාම්බෝජය සමග මාසික පිරිවැය පදනමින් සංසන්දනය කිරීමේදී පිරිවැය හා සම්බන්ධ අපේ ශ්‍රමයේ තරඟකාරීත්වය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (ii) හි සඳහන් අනෙකුත් රටවල් සමඟ සංසන්දනය කිරීමේදී ශ්‍රී ලංකාව ආයෝජකයකු වීමට හැකියාව ඇති අයෙකුට ලබාදෙනු ලබන බදු ප්‍රතිලාභ කවරේද;

(ii) ශ්‍රී ලංකාවේ ආයෝජකයින්ට, නිෂ්පාදකයින්ට හා සේවා සැපයුම්කරුවන්ට දැනට අදාළ වන විවිධ බදු වර්ග කවරේද;

(iii) ශ්‍රී ලංකාවේ ආයෝජනය කරන ශ්‍රී ලාංකික ආයෝජකයකුට දැනට ලබාදෙන බදු ප්‍රතිලාභ සහ බදු නිදහස් කිරීම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1538/'11

ගරු අජිත් කුමාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) හබරාදූව අධ්‍යාපන කොට්ඨාසයේ, දික්කුඹුර ආදර්ශ කණිටු විද්‍යාලයේ, වර්ෂ 2003 සිට 2010 දක්වා කාලය තුළ, එක් එක් වර්ෂයේ ආරම්භයේදී;

(i) අධ්‍යාපනය ලැබූ මුළු සිසුන් සංඛ්‍යාව හා එක් එක් ශ්‍රේණිවල සිසුන් සංඛ්‍යාව;

(ii) ගුරුවරුන් සංඛ්‍යාව;

(iii) පළමුවැනි ශ්‍රේණියට අයදුම්කළ සිසුන් සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ආ) එම පාසලේ, 2003 සිට 2010 වර්ෂය දක්වා කාල සීමාවේදී,

(i) ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති;

(ii) එම ව්‍යාපෘති සඳහා මුදල් ප්‍රතිපාදන ලබා දුන් පුද්ගලයන් හා ආයතන;

(iii) රජයේ ආයතනයකින් මෙම පාසලට ලබා දුන් සංවර්ධන ව්‍යාපෘති;

කවරේද යන්න වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1575/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2003 වර්ෂයේදී කම්කරු සබඳතා හා මිනිස්බල අමාත්‍යාංශය යටතේ රැකියා පියස නම් ව්‍යාපෘතියක් ආරම්භ කරන ලද බවත්;

(ii) මෙම ව්‍යාපෘතියට අනුයුක්ත සේවකයින් 2003 වර්ෂයේ සිට මේ දක්වා කොන්ත්‍රාත් පදනම මත සේවය කරනු ලබන බවත්;

(iii) මේ වනවිට මාස කිහිපයක සිට එම සේවකයින් සඳහා වැටුප් ගෙවීම පවා නතර කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම සේවක පිරිස සඳහා කඩිනමින් වැටුප් ගෙවීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) රැකියා පියස යටතේ බඳවා ගන්නා ලද සේවක පිරිස මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවට අනුයුක්තකර ස්ථිර කිරීමේ සැලසුමක් තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රමවේදය කවරේද;

(iii) එසේ අනුයුක්ත කිරීමක් කරන්නේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1676/'11

ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2006 වර්ෂයේ සිට මේ දක්වා කාල සීමාව තුළ වෙළඳ ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘතීන් කවරේද;

(ii) එම ව්‍යාපෘතීන් හරහා ජනතාවට ලැබී ඇති ප්‍රතිලාභ කවරේද;

(iii) වෙළඳ ක්ෂේත්‍රයේ ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන ව්‍යාපෘතීන් කවරේද;

(iv) ඒවායින් අපේක්ෂිත ප්‍රතිඵල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1688/'11

ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා,— සම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2006 වර්ෂයේ සිට මේ දක්වා කාල සීමාව තුළ සම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘතීන් කවරේද;

(ii) එම ව්‍යාපෘතීන් හරහා ජනතාවට ලැබී ඇති ප්‍රතිලාභ කවරේද;

(iii) ඉදිරියේදී සම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන ව්‍යාපෘතීන් කවරේද;

(iv) ඒවායින් අපේක්ෂිත ප්‍රතිඵල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද ?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1729/'11

ගරු අනුර දිසානායක මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දික්ඕවිට ධීවර වරාය ඉදිකිරීම සඳහා කැබිනට් අනුමතිය ලැබී තිබේද;

(ii) එසේ නම්, එම අනුමතිය ලද දිනය කවරේද;

(iii) වරාය ඉදිකිරීම සඳහා අරමුදල් සපයා ගනු ලබන ආකාරය සහ අවශ්‍ය මුළු මුදල කවරේද;

(iv) එයින් අධාර ලෙස ලැබෙන මුදල හා ණය වශයෙන් ලබා ගන්නා මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ලබා ගන්නා ණය මුදලේ පොලී අනුපාතිකය හා ආපසු ගෙවිය යුතු කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ධීවර වරායේ ඉදිකිරීම් කටයුතු ලබාදුන් සමාගම කවරේද;

(ii) එම සමාගම තෝරාගනු ලැබූ ක්‍රමවේදය කවරේද;

(iii) සමාගම තෝරා ගැනීමේදී ටෙන්ඩර් කැඳවන ලද්දේ නම්, අනෙකුත් සමාගම් ඉදිරිපත් කරන ලද මිල ගණන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1804/'11

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කුලියාපිටිය, කෝන්ගහගෙදර සිට පූගල්ල දක්වා මාර්ගයේ කාපට් ඇතිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(ii) එම මාර්ගය කාපට් ඇතිරීමේ ව්‍යාපෘතිය සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(iii) එසේ නම්, ඒ සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කරනු ලැබූ කොන්ත්‍රාත්කරුවන් කවුරුන්ද;

(iv) එම එක් එක් කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කළ මිල ගණන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1810/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2008 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා වර්ෂවල විදේශ රටවල තානාපති සේවයේ පළමු ලේකම් තනතුරට පත් කිරීම සඳහා තරග විභාග පැවැත්වූයේද;

(ii) එසේ නම්, එම විභාග පවත්වන ලද කාල සීමාවන් කවරේද;

(iii) එම ලේකම් තනතුර සඳහා නිලධාරීන් පත් කිරීමට අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (iii) හි සඳහන් ක්‍රමවේදය අනුව ඉහත එක් එක් වර්ෂවලදී පළමු ලේකම් තනතුර සඳහා පත්වීම් ලබා දුන් අයගේ නම් කවරේද;

(ii) එම තනතුර සඳහා විදේශ සේවයට පිටතින් පුද්ගලයින් බඳවාගෙන තිබේද;

(iii) එසේ නම්, එම බඳවා ගැනීම් සිදු කළ පදනම කවරේද;

(iv) එලෙස බඳවා ගත් අයගේ සුදුසුකම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) විදේශ සේවයට පිටතින් ඉහත තනතුර සඳහා පත්වීම් ලබා දුන්නේ නම්, ඔවුන් තෝරා ගැනීම සඳහා තරඟ විභාගයක් පැවැත්වූයේද;

(ii) නොඑසේ නම්, විදේශ සේවයේ නියුතු පිරිස එක් පදනමක් යටතේද, පිටස්තර පුද්ගලයින් වෙනත් පදනමක් යටතේද එම තනතුරට බඳවා ගැනීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1919/'11

ගරු අජිත් පී. පෙරේරා මහතා,— පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011.09.01 දින වන විට මරණීය දණ්ඩනයට යටත් කොට ඇති (සියලු අභියාචනා අවසන්ව ඇති) බන්ධනාගාරගත සිරකරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් සිරකරුවාට මරණ දඬුවම හිමි වීමට හේතුවූ ඔවුන් විසින් සිදුකර ඇති "අපරාධ" වල වර්ගීකරණය කවරේද;

(iii) එම සිරකරුවන්ට නියමිත මරණීය දඬුවම ක්‍රියාත්මක නොකිරීමට හේතුව හෝ හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මරණ දඬුවම නියම වූ ඇතැම් අයට සමාවදීමේදී රජය විසින් අනුගමනය කරනු ලබන ප්‍රතිපත්තිය කුමක්ද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2011/'11

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "ජන සෙවන" නිවාස ව්‍යාපෘතිය යටතේ ආදිවාසීන් සඳහා නිවාස ලබා දීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මකවේද;

(ii) එසේ නම්, ඒ යටතේ නිවාස ලබාදීම සඳහා තෝරාගත් ආදිවාසී ජන කොට්ඨාස කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිවාස අවශ්‍යතාවය ඇති බවට හඳුනාගත් ආදිවාසී පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) අදාළ නිවාස ආදිවාසී සංස්කෘතිකමය අවශ්‍යතාවන්ට අනුව ඉදිකිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2050/'11

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට මූලික රෝහලට ප්‍රතිකාර සඳහා පැමිණෙන අක්ෂි රෝගීන්ට හම්බන්තොට නගරයේ පෞද්ගලික ඇස් පරීක්ෂාකරන ස්ථානවලින් ඇස් කණ්නාඩි හා අක්ෂි කාච ලබාගන්නා ලෙස රෝහල් නිලධාරීන් උපදෙස් දෙන බවත්;

(ii) එම ආයතන විසින් අක්ෂි කාච අධික මිලකට අලෙවි කරන බවත්;

(iii) රෝහල් නිලධාරීන්ගේ ක්‍රියා කලාපය නිසා අසරණ රෝගීන් විවිධ අපහසුතාවලට පත්වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) අක්ෂි සායනයේ පවතින ඉහත තත්ත්වය පිළිබඳ විශේෂ පරීක්ෂණයක් පවත්වා දූෂණ ක්‍රියා නතර කරවීමට පියවර ගන්නේද;

(ii) රෝහලෙන් නිකුත් කරනු ලබන පරීක්ෂණ වාර්තා අනුව අක්ෂි රෝගීන්ට නිර්දේශිත ඇස්කණ්නාඩි හා අක්ෂි කාච රාජ්‍ය ඔසුසලෙන් අවම මිලකට ලබා ගැනීම සඳහා පහසුකම් සළසා දෙන්නේද;

(iii) රාජ්‍ය ඔසුසලෙන් නිකුත් කරනු ලබන අක්ෂි කාච යොදාගෙන රෝගීන්ට ප්‍රතිකාර කිරීමට අවශ්‍ය උපදෙස් රෝහල් බලධාරීන්ට ලබා දීමට කටයුතු කරන්නේද;

(iv) ඊට අදාළව ගැටලු මතුවන්නේ නම්, එම රෝහල සහ රාජ්‍ය ඔසුසල ඒකාබද්ධව වැඩසටහනක් හඳුන්වාදීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1519/'11

ගරු රවී කරුණානායක මහතා,— පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) 2010 සහ 2011 යන වර්ෂයන්හිදී,

(i) පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය විසින්, එම අමාත්‍යාංශයට අයත් නොවන ගොඩනැගිලි කුලියට හෝ බද්දට ලබා ගැනීම සඳහා දරන ලද මුළු පිරිවැය කොපමණද;

(ii) කුලියට හෝ බද්දට ලබා ගත් ගොඩනැගිලිවල වර්ග අඩියක් සඳහා කුලිය කොපමණද;

(iii) එම ගොඩනැගිලිවල බදු කාලය කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමිය සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශය යටතේ ඇති කිසිදු ආයතනයකට අයත් නොවන වාහන කුලියට හෝ බද්දට ලබා ගැනීම සඳහා වැය කළ මුළු මුදල කොපමණද;

(ii) කුලියට හෝ බද්දට ලබාගත් මුළු වාහන සංඛ්‍යාව කොපමණද;

(iii) බාහිරින් ලබාගත් අනෙකුත් සේවාවන් කවරේද;

(iv) ඉහත සඳහන් බාහිරින් ලබාගත් සේවාවන් සඳහා දරනු ලැබූ පිරිවැය කොපමණද;

(v) බාහිරින් සේවා ලබා ගැනීමේ පදනමින් ගිවිසුම්වලට එළඹීමෙන් අනතුරුව සේවය සපයන පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද; සහ

(vi) කාර්ය මණ්ඩලයේ මුළු සේවක සංඛ්‍යාව කොපමණද;

යන්න පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයට අදාළව ඉහත කී වර්ෂ සඳහා වෙන් වෙන් වශයෙන් එතුමිය සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1576/’11

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, බෙලිඅත්ත ප්‍රදේශයේ පිහිටි, ඉහළ බෙලිගල්ල ග්‍රාමීය රෝහලේ බාහිර රෝගී අංශය පවත්වාගෙන යන ගොඩනැගිල්ල දැඩි සේ අබලන් වී ඇති බවත්;

(ii) මෙම තත්ත්වය ප්‍රතිකාර ගැනීමට පැමිණෙන රෝගීන්ගේ සහ කාර්ය මණ්ඩලයේ ජීවිතවලට ද තර්ජනයක් වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කරන්නේද;

(ii) ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කර තිබේ නම්, ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1775/’11

ගරු අජිත් කුමාර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ගාල්ල මහමෝදර රෝහලේ,

(i) ක්‍රියාත්මක වාට්ටු හා අනෙකුත් අංශ කවරේද;

(ii) සුනාමි ව්‍යසනයේදී සිදුවූ හානි කවරේද;

(iii) රෝගීන්ට ප්‍රතිකාර කිරීමට සුදුසු තත්ත්වයක් තිබේද;

(iv) වර්තමාන ස්ථානයේ වෙනසක් කිරීමට තීරණයකර තිබේ නම්, ඊට අදාළව ගෙන ඇති විකල්ප ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) කරාපිටිය රෝහල ආසන්නයේ මාතෘ හා ළමා රෝහලක් ඉදිකිරීම අරඹා තිබේ නම්, එය ආරම්භකළ දිනය, ඊට ඇස්තමේන්තුගත මුදල හා වත්මන් ප්‍රගතිය;

(ii) රෝහල් සැලැස්ම අනුව එහි අඩංගු අංශ පිළිබඳ විස්තර;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) එම රෝහල ඉදිකිරීමට,

(i) මුදල් ලබාදුන් හෝ ලබාදීමට අපේක්ෂිත පුද්ගලයන් හෝ ආයතන;

(ii) දැනට ලබා දී ඇති මුදල;

(iii) මුදල් වැය කර ඇති ආකාරය;

(iv) වැය නොකර ඉතිරිවූ මුදල සහ එම මුදල් යෙදවූ කාර්යය;

(v) දැනට රජයේ ප්‍රතිපාදන වෙන්කර තිබේ නම්, එම මුදල;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) එම රෝහල ඉදිකිරීමේදී මූල්‍ය වංචාවක් හෝ දූෂණයක් සිදුවී තිබේද;

(ii) එසේ නම්, ඊට අදාළව පරීක්ෂණයක් පවත්වා නිසි ක්‍රියාමාර්ග ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

1811/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2004 වර්ෂයේ දී ජාතික පශු සම්පත් මණ්ඩලයේ සභාපතිවරයා, විධායක අධ්‍යක්ෂවරයා හෝ ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයා හා අධ්‍යක්ෂවරයෙකු ලැබූ වැටුප, ඉන්ධන දීමනා, දුරකථන දීමනා, වෙනත් දීමනා, සංග්‍රහ වියදම්, මාසික අධ්‍යක්ෂ මණ්ඩල දීමනා යනාදිය එක් එක් තනතුර අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2004 වර්ෂයෙන් පසු ඉහත තනතුරුවලට අදාළ වැටුප් හෝ අනෙකුත් දීමනා වෙනස් වූ වර්ෂ කවරේද;

(iii) 2011 වර්ෂයේදී ඉහත තනතුරුවලට අදාළ වැටුප් හා දීමනා කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

## දින නියමයක් නොමැති යෝජනා පිළිබඳ දැනුම්දීම

පා. 156/'12

ගරු ජෝන් අමරතුංග මහතා

ගරු තිස්ස අත්තනායක මහතා

ගරු එම්.ජෝශප් මයිකල් පෙරේරා මහතා

ගරු කබීර් හෂීම් මහතා

ගරු මංගල සමරවීර මහතා

ගරු පී. හැරිසන් මහතා

ගරු ආර්. යෝගරාජන් මහතා

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— 2011 වර්ෂයේ අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයේ ප්‍රතිඵල සම්බන්ධ ගැටලු පරීක්ෂා කර බලා ඒවා නිරාකරණය කර ගැනීමට අවශ්‍ය ප්‍රතිකර්ම නිර්දේශ කිරීම සඳහා වූ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,—

2011 අධ්‍යයන වර්ෂය සඳහා අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයේ ප්‍රතිඵල නිකුත් කිරීම බරපතළ ගැටලු ඇති කොට ඇති හෙයින්ද;

විවිධ පාර්ශ්ව විසින් පරස්පර විරෝධී ප්‍රකාශ සිදු කරමින් ඇති හෙයින්ද;

ගැටලු ඇති වී ඇත්තේ තාක්ෂණික දෝෂ හේතුවෙන් බව සමහර පාර්ශ්ව ප්‍රකාශ කරන හෙයින්ද;

ප්‍රතිඵල නිකුත් කිරීමේදී ඇතිවූ අනවශ්‍ය හදිසිය සම්බන්ධයෙන් තවත් සමහර අය චෝදනා කරන හෙයින්ද;

අදාළ නිලධාරීන්ගේ අකාර්යක්ෂමභාවය නිසා ගැටලු මතුවී ඇතැයි තවත් සමහරු චෝදනා කරන හෙයින්ද;

විභාග කොමසාරිස්වරයා ස්වකීය ධූරයෙන් මුදා හැර ඇති හෙයින්ද;

මෙම කාරණය සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමට ජනාධිපතිවරයා තමා විසින්ම කොමිසමක් පත් කර ඇති හෙයින්ද;

සමස්ත ශිෂ්‍ය පරම්පරාවකම අනාගතය විපතට පත් කර ඇති හෙයින්ද;

අධ්‍යාපන පද්ධතිය පිළිබඳ විශ්වාසය දැඩිලෙස බිඳවැටීමට මෙය හේතු වී ඇති හෙයින්ද;

අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද සහතික පිළිගැනීම සම්බන්ධයෙන් සැක මතුව ඇති හෙයින්ද;

පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කළ යුතු යැයි මෙම සභාව යෝජනා සම්මත කරයි:—

(අ) Z ලකුණු ක්‍රමය සහ එය ක්‍රියාත්මක කරන ආකාරය පරීක්ෂා කිරීමට;

(ආ) මෙම ගැටලුවට පාදක වූ හේතු පරීක්ෂා කිරීමට;

(ඇ) 2011 වර්ෂය සඳහා වූ අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයේ ප්‍රතිඵල පිළිබඳ ගැටලු නිරාකරණය කර ප්‍රතිකර්ම නිර්දේශ කිරීමට;

(ඈ) එවැනි ගැටලු අනාගතයේදී ඇති වීම වළකාලීම සඳහා ගත යුතු පියවර නිර්දේශ කිරීමට; සහ

(ඉ) කාරක සභාව විසින් අවශ්‍ය යැයි තීරණය කරන්නා වූ වෙනත් ප්‍රතිකර්ම නිර්දේශ කිරීමට

2. (අ) එම කාරක සභාව සහ එහි සභාපති කථානායකතුමා විසින් නම් කළයුතු වන්නේය.

(ආ) ස්ථාවර නියෝග 95හි විධි විධානවල කුමක් සඳහන්ව තිබුණද, කාරක සභාව සාමාජිකයන් විසිඑක් දෙනෙකුට (21) නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතුය.

3. එම කාරක සභාවට,—

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමටද;

(ආ) සිය කාරක සභාව ඉදිරියේ පෙනී සිටින ලෙස යම් තැනැත්තෙකු කැඳවීමටද, යම් ලේඛනයක් හෝ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස යම්

තැනැත්තෙකුට නියම කිරීමටද, ඉහත සඳහන් කරුණු පූර්ණ ලෙස සලකා බැලීම පිණිස අවශ්‍ය යැයි කාරක සභාව කල්පනා කරන ලිඛිත හෝ වාචික සාක්ෂි ලබා ගැනීමට හා භාර ගැනීමටද;

(ඇ) සාක්ෂිකරුවන් වාචිකව පරීක්ෂා කිරීම මගින් සත්‍ය අසත්‍යතාව විමසීමෙන් හෝ අන්‍යාකාරයකින් තහවුරු කරගැනීමටද, කාරක සභාවේ සභාපතිවරයා හෝ එම කාර්යය සඳහා විශේෂයෙන් බලය පවරන ලද තැනැත්තෙකු විසින් දිවුරවනු ලැබූ හෝ ප්‍රතිඥා දීමට සලස්වනු ලැබූ සාක්ෂිකරුවන් පරීක්ෂා කිරීමටද;

(ඈ) කාරක සභාවේ සභාය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයන්ගේ සහ ප්‍රවීණයන්ගේ සේවය ලබා ගැනීමට; සහ

(ඉ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමටද, පාර්ලිමේන්තුව කල් තබන ලද්දේ වුවද රැස්වීම් පවත්වා ගෙන යාමටද

බලය තිබිය යුතුය.

4. සිය පළමු රැස්වීම් වාරයේ සිට වසරක් ඇතුළත හෝ පාර්ලිමේන්තුව විසින් අවසර ලබා දෙන එවැනි වෙනත් හෝ වැඩිදුර කාලයක් ඇතුළත කාරක සභාව සිය වාර්තාව ඉදිරිපත් කළ යුතුය.